# වියළි කලාපීය වැව් ආශ්‍රිතව සාම්ප්‍රදායික රීති පද්ධතියෙහි වර්තමාන අනාගත ප්‍රවණතා පිරික්සීමක්.

**කුමාරි අයි.ඒ.වී.පී.කේ.[1]**

ස්වාභාව ධර්මයාගෙන් වියළි කලාපීය ජනයාගේ ජල අවශ්‍යතාවයට එල්ල වූ  අභියෝගයට අතීත ජනයා සාර්ථකව මුහුණ දුන්නේ වාරිමාර්ග පද්ධතිය නම් විශ්මිත නිර්මාණය නිමවීමෙනි. රජරටවාසීන් සෑම ගමක් සතුවම තිබුණු වැව තම දිවිහිමියෙන් ආරක්ෂා කර තිබේ. වැව නම් වටිනා නිර්මාණය තිරසාරව පවත්වා ගැනීම වෙනුවෙන් පැරණි ජනයා සාම්ප්‍රදායිකව රීති පද්ධතියක් පවත්වාගෙන එනු ලබයි. ව්‍යවහාරයේ දී තහංචි නම්වන මෙම රීති පද්ධතිය සමාජය ලද අත්දැකීම් මත ඔවුන් විසින්ම ගොඩනගා ගන්නා ලද්දක් බව පැහැදිලිය. උක්ත පර්යේෂණයේ ප්‍රධානතම අරමුණු වශයෙන් වැව හා සම්බන්ධව අතීතයේ සිට ගොඩනැගී පැවත එන්නා වු සාම්ප්‍රදායික රීති පද්ධතිය හඳුනාගැනීම හා එහි වර්තමාන අනාගත ප්‍රවණතා පිරික්සීමයි. මෙහි උප අරමුණු වශයෙන් අදාල රීති පද්ධතියෙන් අපේක්ෂිත අරමුණු හඳුනාගැනීම හා අදාල රීති පද්ධතියෙහි ඇති වටිනාකම සමාජගත කිරීමත් අපේක්ෂා කරනු ලබයි. දත්ත ලබා ගැනීම සඳහා ද්විතියික ක්‍රමවේදයන් හා ප්‍රාථමික ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී. මූලික වශයෙන් තොරතුරු රැස් කර ගැනීම සඳහා ද්විතියික  ක්‍රමවේද යටතේ පුස්තකාල අධ්‍යනයේ යෙදුනු අතර ප්‍රාථමික ක්‍රමවේද යටතේ සම්මුඛ සාකච්ඡාවන්හි නියලෙන ලදී. වැවෙහි හා වැව් දියෙහි වටිනාකම වටහා ගන්නා ලද අතීත ලාංකිකයා සිය දැනුම උපයෝගී කර ගනිමින් වැව හා වැව් ජලය ආරක්ෂා කර ගැනීමට, මත්ස්‍ය සම්පත රැකගැනීමට මෙන්ම වැවේ පැවැත්ම වෙනුවෙන් විවිධ වූ ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේ. මංකඩ වෙන් කිරීම හා ඒ ආශ්‍රිත තහංචි, කට්ට කැපීම හා වනාත් කෙටීම වැනි වැව පිළිසකර කිරීමේ ක්‍රමවේද, වැව් තාවුල්ලේ හා කට්ටකඩුව ආශ්‍රිත ක්‍රමවේද මෙන්ම අණබෝල බැඳීම වැනි ක්‍රියාපිලිවෙත් ඒ අතර ප්‍රධාන වෙයි. මෙම රීති පද්ධතිය කිසිවෙකුට හානිදායක් නොවූ වැව තිරසාර ලෙසින් භාවිත කිරීමට ගන්නා ලද වටිනා පියවරක් වශයෙන් පෙන්වාදිය හැකිය. වර්තමාන සමාජ, ආර්ථික හා දේශපාලනිකමය ක්‍රියාවලින්හි සිදුව ඇති වෙනස්කම් හා සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් මෙම රීති පද්ධති බෙහෙවින් සමාජයෙන් ගිලිහී යන බවක් හඳුනාගත හැකිය. එමෙන්ම අද වනවිට විදානේ, ගමරාල යන තනතුරු දැරුවන් නාමික තනතුරු දරන්නන් බවට පත්ව ඇති අතර සාම්ප්‍රදායික දැනුම උකහා ගැනීමට වර්තමාන සමාජය වැඩි අවදානයක් යොමු නොකරන බවද හඳුනාගත හැකි කාරණයකි.

**ප්‍රමුඛ පද :** වියළි කලාපය, වැව්, සාම්ප්‍රදායික, රීති පද්ධතිය, ප්‍රවණතා

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය , ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
priyamalikalani@gmail.com